ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணிஆணையாளர்நாயகத்தின்திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
'මිහිකත මැදුර' ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6,රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
1200/6, ராஜமல்வத்தவீதி,பத்தரமுல்ல.
1200/6, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனதுஇல / MY NO

ඔබේ අංකය / உமதுஇல / YOUR NO

දිනය / திகதி / DATE 2018.10. 10

වෙබ් ලිපිනය -இணையம் – Web Address – www.lancommdept.gov.lk ඊමේල් -ஈ-மெயில் - E-mail - landcom@landcommdept.gov.lk

චක්‍රලේඛ අංක : 2018/03

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්
අන්තර් පළාත් නියෝජ්‍ය/ සහකාර ඉඩම් කොමසාරිස්වරුන්

## රජයේ ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීමේ කඩිනම් වැඩසටහන

ජනතාවගේ ඉඩම් හිමිකම තහවුරු කිරීමේ ජාතික ප්‍රතිපත්තියට අනුව ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ රජයේ ඉඩම් කැබලි මිලියන 1.1ක් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීමට රජය ඉලක්ක ගතකර තිබේ. මෙම වැඩසටහන 2018-2020 දක්වා ක්‍රියාත්මක වීමට නියමිතය. එහි පළමු අදියර 2018 ජුලි මාසයේ සිට 2018 දෙසැම්බර් මස දක්වා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව අතර ඒකාබද්ධ ප්‍රවේශයක් ලෙස සිදු කිරීම සඳහා අමප/18/1377/805/034 හා 2018.07.10 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබේ. ඒ අනුව 2018 වර්ෂයේ අවසන් අර්ධ භාගයේදී 24,000ක් වූ බලපත්‍ර හිමියන් සඳහා දීමනාපත්‍ර 24,000ක් නිකුත් කිරීමට නියමිතව ඇත.

මාස හයක කාල සීමාවක් තුළ දීමනාපත්‍ර 24,000ක් නිකුත් කිරීමේ අභියෝගයට මුහුණදීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේනතුව සමඟ ඒකාබද්ධව ක්ෂේත්‍රයේ පවතින ගැටලු කඩිනමින් හඳුනා ගැනීමත්, එම ගැටළු සඳහා කඩිනම් පිළියම් යෙදීමත් කළ යුතුය. ඒ අනුව ඉඩම් මැනුම් කරන අවස්ථාවේදීම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ක්ෂේත්‍රයේ පවතින ගැටලු හඳුනා ගැනීම මෙම වැඩසටහනේ අරමුණ වේ. මෙහි නියමු ව්‍යාපෘතිය ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය නියැදියක් වශයෙන් ගෙන ක්‍රියාත්මක කරනු ලැබේ. එම නියැදි පරීක්ෂාව තුළින් හඳුනාගත් ක්ෂේත්‍රයේ පවතින ගැටලුවලට විසඳුම් ලබාදීමෙන් මෙම වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම ලබාදීම මෙම චක්‍රලේඛය නිකුත් කිරීමේ අරමුණ වේ.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පවත්නා නීති රීතිවලට හා මෙම චක්‍රලේඛය මඟින් ලබාදෙන උපදෙස් හා මඟපෙන්වීම්වලට අනුගත වෙමින් පවතින සම්පත් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කරමින් හා මනා සම්බන්ධීකරණයකින් යුතුව උපරිම ඵලදායීතාවයක් ළඟාකර ගැනීම සඳහා ක්‍රියා කිරීම සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ගේ හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ වගකීම වේ. මෙම අභියෝගගත ඉලක්කයට සාර්ථකව මුහුණදීම සඳහා සියලුම සම්බන්ධිත ආයතන සම්බන්ධීකරණය කිරීමට අපේක්ෂා කරන අතර එහිදී දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගති සමාලෝචන හා පසු විපරම් කටයුතු සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් මඟින්ද, පළාත් මට්ටමේ ප්‍රගති සමාලෝචන හා පසු විපරම් කටයුතු සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරු මඟින්ද, සිදු කිරීමට අපේක්ෂා කෙරේ.


| ඉ.කො.ජ. කාර්යාලය (පොදු) கா.ஆ.நா.பொது General | පාලන நிர்வாகம் Administration | ගිණුම් கணக்கு Accounts | ඉඩම් I காணி I Land I | ඉඩම් II காணி II Land II | ඉඩම් III காணி III Land III |
|---|---|---|---|---|---|
| දුරකතන - 0112797400 | දුරකතන - 0112797479 | දුරකතන - 0112875833 | දුරකතන - 0112874025 | දුරකතන - 0112875834 | දුරකතන - 011279748 |
| ෆැක්ස්- 0112864051 | ෆැක්ස්- 0112873033 | ෆැක්ස්- 0112864462 | ෆැක්ස්- 0112883812 | ෆැක්ස්- 0112873110 | ෆැක්ස්- 0112883635 |

**1. ඉඩම් නොමැති පුද්ගලයන් සහ අවිධිමත් ලෙස ඉඩම් පරිහරණය කරන පුද්ගලයන් ලියාපදිංචි කිරීම.**

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම සෑබෑ ලෙසම ඉඩම් නොමැති පුද්ගලයන් සහ අවිධිමත් ලෙස ඉඩම් පරිහරණය කරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමට පියවරගත යුතුය. ඒ අනුව ඉඩම් නොමැති පුද්ගලයන් ලියාපදිංචි කිරීම සඳහා වූ පුවත්පත් නිවේදනය ඉඩම් කොමසාරිස් ජනරාල්/ පළාත් ඉඩම් කොමසාරිස් මගින් සිදු කරන අතර නිශ්චිත කාල පරාසයක් නොමැතිව වසරේ ඕනෑම කාලයකදී ඉදිරිපත් වන පුද්ගලයෙකු ඉඩම් නොමැති පුද්ගලයන්ගේ ලේඛණයෙහි ලියාපදිංචි කර ගැනීමට පියවර ගත යුතුය. මූලික අයදුම්පත් පරීක්ෂාවෙන් හා ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් අනතුරුව අයදුම්කරුවන් ඉ.කො. 157 ලේඛනයට ඇතුළත් කර ගැනීමට කටයුතු කරන්න.

එහිදී නව ඉඩම් ඉල්ලුම්කරුවන් හා අවිධිමත් ලෙස ඉඩම් භුක්ති විඳින පුද්ගලයන් වෙන වෙනම ලියාපදිංචි කිරීමට පියවර ගැනීමෙන් ඉඩම් කච්චේරි ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව සිදු කළ හැකිය. මෙම වැඩසටහන යටතේ අවිධිමත් ලෙස ඉඩම් භුක්ති විඳින්නන්ගේ ඉඩම් කැබලිද උපරිම සීමාවන්ට යටත්ව මැනුම් කිරීම හා එම කැබලිද ඇතුළත්ව ව්‍යවස්ථාපිත පිඹුරක් සකස් වන බැවින් අවිධිමත්ව ඉඩම් භුක්ති විඳින පුද්ගලයන් කඩිනමින් ඉඩම් කච්චේරි වැඩසටහනක් මගින් විධිමත් තෝරා ගැනීමකට ලක්කර බලපත්‍ර ලබාදීමට පියවර ගත යුතුය. එහිදී සිදුවන අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීමට ක්‍රියා කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ වගකීම වේ.

**2. බලපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයට වඩා වැඩිපුර භුක්ති විඳින ප්‍රමාණයන් නියමානුකූල කිරීම.**

මෙහිදී මාගේ 2013/2 චක්‍රලේඛයේ හා 2014/9 චක්‍රලේඛවල ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතු අතර. බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා භුක්ති විඳින ප්‍රමාණය 10% කට වැඩි වුවද, එම වැඩි වන ප්‍රමාණය පළාත් පාලන ආයතනයේ අවම බෙදුම් සීමාවට අඩු නම් එම මුළු ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රයක් ලබාදිය හැකිය. බලපත්‍රයේ ප්‍රමාණයට වඩා මෙම පුද්ගලයන් විසින් ඉඩම් සංවර්ධනය කර අඛණ්ඩව භුක්ති විඳින විට භුක්තිකරුවන් ඉවත් කිරීම හා භුක්තිකරුගේ පවුලෙන් බාහිර පුද්ගලයන් වෙත ලබාදීම ප්‍රායෝගික දුෂ්කර අවස්ථාවලදී පවරන නීති රීති වලට අනුකූලව ඉඩම් ලබාදීමට හැකි පරිදි ක්‍රියාමාර්ග ගත යුතුය.

(අ) එම වැඩිවන ප්‍රමාණය පළාත් පාලන ආයතනයේ අවම බෙදුම් සීමාව ඉක්මවා යන අවස්ථාවලදී පවුල් ඒකකයට ලබාදිය හැකි උපරිම සීමාවන්ට යටත්ව එම වැඩිවන ප්‍රමාණය සඳහා ඉඩම් කච්චේරි ක්‍රියාවලිය මගින් භුක්තිකරු වෙත බලපත්‍ර ලබාදීම.

(ආ) එසේ ලබාදීමෙන් පසුවද තවදුරටත් සංවර්ධනය කර භුක්ති විඳින ඉඩම් ප්‍රමාණයක් වේ නම්, භුක්තිකරුගේ පවුලේ විවාහක දරුවන් වෙත සුදුසුකම් පරීක්ෂා කර බලා උපරිම සීමාවන්ට යටත්ව, ඉඩම් කච්චේරි මගින් ලබාදීම.

(ඇ) තවදුරටත් භුක්ති විඳින අතිරික්ත ඉඩම් ප්‍රමාණයක් වේ නම්, ඉල්ලුම්කරු ගොවිපාන්තික අයෙකු වුවද, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර ලබාදීමට හැකියාවක් නොමැති අතර භුක්තිකරු එකඟ වන්නේ නම්, රජයේ ඉඩම් ආඥා පනත යටතේ කෘෂිකාර්මික හෝ වාණිජ පදනමින් දීර්ඝකාලීන බදු ලබා දීම.

ඉඩම් මැනුම් කිරීමේදී ක්ෂේත්‍රයේ ඇතිවිය හැකි ගැටලු අවම කර ගැනීම සඳහා මේ පිළිබඳව ඉඩම් භුක්ති විඳින්නන් දැනුවත් කිරීමට පියවර ගන්න. මුළු දිවයින පුරාම එකම ක්‍රමවේදයකට කටයුතු කළ යුතු බැවින් මෙම උපදෙස් පරිදි කටයුතු කිරීම අනිවාර්යය වේ.

### 3. අවිධිමත් ලෙස ඉඩම් භුක්ති විඳින පුද්ගලයන් කඩිනම් වැඩසටහනට ඇතුළත්කර ගැනීම.

අවිධිමත් ලෙස ඉඩම් භුක්ති විඳින පුද්ගලයන් කඩිනමින් ඉඩම් කච්චේරි සඳහා යොමුකර පවතින නීති රීතිවලට අනුකූලව බලපත්‍ර ලබාදීමට පියවර ගත යුතුය.

කෙසේවුවද, අවිධිමත්ව ඉඩම භුක්ති විඳිමින් සංවර්ධනය කර ඇති පමණින් එම පුද්ගලයන් විධිමත් ඉඩම්ලාභීන් බවට පත් කිරීම නොකළ යුතු බව අවධාරණය කරමි. රජයේ ඉඩමක් ලැබීමට සුදුසු පුද්ගලයන් පමණක් දැනටමත් හඳුන්වා දී ඇති චක්‍රලේඛයේ උපරිම සීමාවන්ට යටත්ව විධිමත් තෝරා ගැනීමකට ලක් කිරීමට වගබලාගත යුතු අතර රක්ෂිත හෝ කිසිසේත් බැහැර කළ නොහැකි රජයේ ඉඩම් අනවසරයෙන් භුක්ති විඳින පුද්ගලයන් නියමානුකූල කිරීමට කටයුතු නොකළ යුතු බව අවධාරණය කරමි.

ඉහත සඳහන් කළ ක්‍රමවේදය හඳුන්වාදීමේ අරමුණ වන්නේ මෙම කඩිනම් වැඩසටහනින් ප්‍රතිලාභ බහුතරයක් මහජනතාවට හිමිකර දීම විනා අවිධිමත්ව රජයේ ඉඩම් අල්ලා ගැනීම ප්‍රවර්ධනය කිරීමක් නොවේ. සංවිධානාත්මකව සහ පුද්ගලයන් විසින් රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම වළක්වාලීම සඳහා පියවරගත යුතුය. එහිදී ග්‍රාම නිලධාරී මගින් දෙසතියකට වරක් ආ.ඒ.ආ. 60 ආකෘතිය මගින් අනවසර අල්ලා ගැනීම් පිළිබඳ වාර්තාව ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරුන් පියවරගත යුතු අතර ඒ අනුව අනවසරකරුවන් ඉවත් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

### 4. දත්ත පද්ධතියක් සැකසීම.

මෙම කඩිනම් වැඩසටහන යටතේ සකස් කරනු ලබන දීමනාපත්‍ර වලට අදාළ දත්තවලට පහසුවෙන් ප්‍රවේශ වීමත්, දත්තවල නිවැරදි හා විශ්වාසනීයභාවය තහවුරු කිරීමත්, දීමනාපත්‍ර ලබාදීම කඩිනමින් හා නිවැරදිව කළ යුතු බැවින් ආයතන හරහා ලිපි ගනුදෙනු වීමේ අනවශ්‍යය ප්‍රමාදය අවමකර ගැනීමත්, වැඩසටහනේ සාර්ථකත්වය සඳහා අත්‍යාවශ්‍යය වේ. එබැවින් රජයේ ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය (e-Slims) මගින් දීමනාපත්‍ර එවීම සඳහා හැකි සෑම අවස්ථාවකදීම පියවරගත යුතු බව අවධාරණය කරමි.

### 5. පසු විපරම් හා ප්‍රගති සමාලෝචන කටයුතු.

දීමනාපත්‍ර ලබාදීමේ කඩිනම් වැඩසටහනේ ප්‍රගතිය මේ සමඟ අමුණා ඇති ඇමුණුම 1 අනුව ප්‍රාදේශීය ලේකම් විසින් මාසිකව දිස්ත්‍රික් ලේකම්ට පිටපත් සහිතව පළාත් ඉඩම් කොමසාරිස්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් මගින් මා වෙත එවිය යුතුය. පළාත් ඉඩම් කොමසාරිස්වරුන් සමඟ පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රගතිය සමාලෝචනය කිරීමට නියමිතය. සෑම මසකම මුල් සතිය ඇතුළත පෙර මාසයේ ප්‍රගතිය මා වෙත වාර්තා කළ යුතුය. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය හා ප්‍රාදේශීය ලේකම් විසින් ලබාදෙන ප්‍රගතිය සන්සන්දනාත්මකව ඇගයීමට නියමිත බැවින් නිවැරදි තොරතුරු ලබාදීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ වගකීම වේ.

මෙම චක්‍රලේඛයේ උපදෙස් දීමනාපත්‍ර සකස් කිරීමේ කඩිනම් වැඩසටහන සඳහා නිකුත් කරනු ලබන අතර වැඩසටහන සාර්ථකකර ගැනීම සඳහා කාර්යක්ෂමව ඒකාබද්ධව කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී යම් ගැටලුකාරී තත්ත්වයක් වේ නම් මා වෙතින් උපදෙස් ලබා ගන්නා ලෙසද, තවදුරටත් දන්වා සිටිමි.

ආර්.එම්.සී.එම්. හේරත්

ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ලේකම්, ජනාධිපති කාර්යාලය
2. ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය
3. ලේකම්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
4. සියලුම දිස්ත්‍රික් ලේකම්වරු
5. මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

} - කරු. දැ.ගැ.ස. සහ අ.ක.ස.

ඇමුණුම I

# රජයේ ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීමේ කඩිනම් වැඩසටහන

දිස්ත්‍රික්කය : ............................................

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ............................................

...................................... දිනට ප්‍රගතිය

| 1<br>2018........01 දිනට අත ඇති රේඛා චිත්‍ර ප්‍රමාණය | 2<br>මාසය තුළ ලද රේඛා චිත්‍ර ප්‍රමාණය | 3<br>සකස් කළ දීමනාපත්‍ර ප්‍රමාණය | 4<br>පළාත් ඉඩම් කොමසාරිස්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් වෙත යොමු කළ දීමනාපත්‍ර ප්‍රමාණය | 5<br>අත ඉතිරි රේඛා චිත්‍ර ප්‍රමාණය |
|---|---|---|---|---|
| | | | | |

- ඉහත 5 හි සඳහන් රේඛා චිත්‍ර අතුරින් දීමනාපත්‍ර සකස් කළ හැකි රේඛා චිත්‍ර ප්‍රමාණය කොපමණද? ...........
- දීමනාපත්‍ර සකස් කළ නොහැකි දීමනාපත්‍ර ප්‍රමාණය හා ඒ සඳහා හේතු සඳහන් කරන්න.

  1. ........................................................................................................................
  2. ........................................................................................................................
  3. ........................................................................................................................
  4. ........................................................................................................................
  5. ........................................................................................................................

............................................

ප්‍රාදේශීය ලේකම්

පිටපත් :

1. දිස්ත්‍රික් ලේකම්, .......................... දිස්ත්‍රික්කය
2. පළාත් ඉඩම් කොමසාරිස්, .......................... පළාත